# යාපනය අර්ධද්වීපයේ ළිං

*විජයරාණි සත්ගුණරාජා*
පර්යේෂන හා පුහුණුකිරීමේ නිලධාරිනී
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ශ්‍රී ලංකාවේ උතුරු කෙළවරෙහි පිහිටි යාපනය ප්‍රදේශය වර්ග ප්‍රමාණයෙන් ව. සැ. 400 ක් පමණ වූ අර්ධද්වීපයකි. මෙම අර්ධදීපයේ බටහිර, උතුර හා නැගෙනහිර පෝක් සමුද්‍රසන්ධියෙන් වටවී ඇති අතර, දකුණු ප්‍රදේශය යාපනය කලපුවෙන් වෙන් වී තිබේ. භූමි විෂමතාව ගත්විට එය තැනිතලා බිමක ස්වරූපයක් පෙන්නුම් කරන අතර, අඩි 40 ට වඩා වැඩි වූ උස් බිම් එම ප්‍රදේශයේ දක්නට ඇත්තේ ම නැත. ප්‍රදේශයේ තිබෙන එකම ගඟ තොන්ඩමනාරු නමින් හැඳින්වෙන අතර එය තොන්ඩමනාරු ප්‍රදේශය හරහා මුහුදට ගලා බසියි. තවත් විශේෂ ලක්ෂණයක් නම් ගොඩබිම සිට මුහුදට තිබෙන වැඩිම දුර ප්‍රමාණය සැතෘ 10 කට වඩා කිසිවිටක වැඩිවන්නේ නැත.

අර්ධද්වීපයේ පාෂාණ ව්‍යුහය ගත් විට එහි මව් පාෂාණය සකස් වී ඇත්තේ හුණුගලෙනි. මේ හුණුගල්වල අභ්‍යන්තර කුස්තර වලින් සමන්විතය. එම කුස්තුර තුළ ජලය රඳවා තබා ගැනීමේ හැකියාවක් ඇති බැවින්, වැහි කාලවල දී ඇතිවන වර්ෂාපතනයෙන් යම් ප්‍රමාණයක් භූගත ජලය වශයෙන් හුණුගල් කස්තුර තුළ රැඳෙන අතර කොටසක් මුහුදට ගලා යයි.

සාපේක්ෂ වශයෙන් බලන කල තිරුනෙල්වේලි, කෝපායි සහ අච්චුවේලි යන ප්‍රදේශවල අඩි 21 - 28 දක්වා වූ ගැඹුරින් භූගත ජලයේ ජල මට්ටම රැඳී තිබේ. වෙරළාසන්න ප්‍රදේශයට යත්ම මෙම භූගත ජල මට්ටම අඩි 14 - 18 පමණ වූ මතුපිට ආසන්නයට පැමිණේ. ලවණතාවයෙන් යුතු මෙම ජලය බීමට හා වගාවන්ට ද යොදා ගැනේ.

අභ්‍යන්තර ජල ගබඩාවල ඇති ජලය පොළව මතුපිටට ගැනීමට ආඩියා ළිං භාවිතා කෙරේ. ඒ හැර ජල පොම්ප යොදා ගැනීම ද බහුලව කෙරේ. නගරබද ගෙවල්වල තිබෙන ළිං වල විශ්කම්භය අඩි 10 - 12 ක් වන අතර, ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික ළිං තනා තිබේ. ඒවා විශ්කම්භයෙන් අඩි 15 - 18 පමණ විශාල වේ. මේවායේ ජලය ගෘහ පරිභෝජනයට හා කෘෂිකාර්මික කටයුතු සහ දෙකටම යොදා ගනී. මිනිස් අවශ්‍යතාවය අනුව මේ ළිං ඉදිකිරීමේ දි කාර්යය සකස් වී තිබේ.

මෙම හුණුගල් පාෂාණ අභ්‍යන්තරයේ පිහිටි කුස්තුර වල ජලය පිරී පවතින නිසා වැසි පවතින කාලවලදී ජලය පිළිබඳ ප්‍රශ්නයක් පැන නොනගී. නමුත් මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණ නම් ජලය රඳවා ගැනීමේ ධාරිතාවය කුස්තුර වල ධාරිතාවය අනුව සීමා වන බවයි. ඊසාන දිග මෝසම් සුළං කාලයේ දී යාපන අර්ධද්වීපයට ලැබෙන වර්ෂාපතනය (අහල් 50 - 70) මි. ලී. 1200 - 1700 වේ. වර්ෂාපතනයත් සීමා වන බැවින් හා අභ්‍යන්තර ජල ගබඩාව ඉතා කුඩා නිසාත් අරපිරිමැස්මෙන් යුතුව ජලය පරිහරණය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි ව පෙනේ.

අනාගතයේ දී මතුවිය හැකි ජල හිඟතාවය හා ඒ ආශ්‍රිතව පැන නැගිය හැකි කෘෂිකාර්මික හා සමාජ - ආර්ථික ප්‍රශ්ණ මඟහරවා ගැනීම සඳහා යෝග්‍ය ජල කළමනාකරණ වැඩපිළිවෙලක අවශ්‍යතාවය මෙහිලා අවධාරණය කළයුතුව ඇත.